# උන්සෙඩ් සමුළුව පිළිබඳ දකුණු ආසියානු අනුදර්ශනයක්

එල්. සී. ඒ. ද එස්. විජේසිංහ

දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සමුළුවට (සාක්) අයත් සාමාජික රටවල් වන බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන රටවලට පෘථිවියේ භූමි ප්‍රදේශයෙන් සියයට 11.2 ක් ඇතුළත් වේ. සමාජාර්ථික ක්ෂේත්‍රයෙහි ලා සාක් රටවලට ගැටළු රාශියකට මුහුණ පාන්නට සිදු වී තිබේ. සාක් කලාපය තුළ ජනගහන ඝනත්වය ඉතා අධික (එහි මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 11 ක් ඇතුළත ලෝක ජනගහනයෙන් සියයට 21 ක්) වන අතර ආදායම ඉතා පහත් මට්ටමක (එනම්, ලෝකයේ දළ ජාතික නිෂ්පාදිතයෙන් 1.7 ක් පමණක්) පවතී. ප්‍රධාන ආර්ථික කටයුත්ත කෘෂිකර්මය වන අතර එය තවමත් වැඩි වශයෙන් කැර ගෙන යනු ලබන්නේ සාම්ප්‍රදායික ක්‍රම භාවිතා කරමිනි. කාර්මිකකරණය අඩු මට්ටමක පවතී. ජාත්‍යන්තර වෙළෙඳාමේ ප්‍රධාන තැනක් ගන්නේ කෘෂිකාර්මික වෙළෙඳ ද්‍රව්‍ය සහ අමුද්‍රව්‍ය අපනයනය කිරීම ය. ඒ අතර ම, බොහෝ කාර්මික සහ පරිභෝජන භාණ්ඩ ආනයනය කිරීමට සිදු ව ඇත. ජනගහන වර්ධනයේ සාමාන්‍ය අනුපාතය ඉතා අධික ය. අකුරු නොදන්කම, දුර්වල සෞඛ්‍යාරක්ෂාව සහ නිවාස හා සනීපාරක්ෂාව ප්‍රමාණවත් නොවීම ද බෙහෙවින් පැතිර ඇත. ජනගහනයෙන් විශාල කොටසක් උග්‍ර මන්ද පෝෂණයට ගොදුරු ව ඇත.

**දකුණු ආසියානු රටවල් මුහුණ පාන මූලික පාරිසරික සංවර්ධන ප්‍රශ්න**

දකුණු ආසියානු කලාපය තුළ පරිසරය හා සංවර්ධනය පිළිබඳ පුළුල් ලෙස පැතුරුණු ගැටළු අතර පහත දැක්වෙන ගැටළු ඇති අතර ඒවා දැක්වෙන්නේ නිශ්චිත පිළිවෙලකට අනුව නොවේ. (1) දැනටමත් අධික වී පවත්නා ජනගහන ඝනත්වය සමග ඒකාබද්ධ වී ඇති අධික ජනගහන වර්ධන අනුපාතය (2) ප්‍රධාන වශයෙන් ම, කපා පිළිස්සීමේ කෘෂිකර්මය ව්‍යාප්ත වී යාම හේතු කොට ගෙන වනහරණ අනුපාතය වැඩිවීම. (3) කෘෂිකර්මය සඳහා යොදා ගනු ලබන ඉඩම්වල කළමනාකරණයේ දුර්වලතා නිසා පසට දැඩි ලෙස හානි පැමිණීම (4) වාරිමාර්ග ක්‍රමවලට ඇතුළත් ඉඩම්වල ජල කළමනාකරණයේ දුර්වලකම නිසා ලවණතාව පැතිරීම සහ වතුර රඳා සිටීම (5) නාගරික සහ කාර්මික දූෂණය වඩ වඩාත් අධික වීම (6) නිවාස, සනීපාරක්ෂාව සහ පානීය ජලය ලබා ගැනීමේ හැකියාව කිසිසේත් ප්‍රමාණවත් නොවීම (7) රෝග (8) මන්දපෝෂණය (9) රැකියා වියුක්ති මට්ටම අධික වීම (10) ජල ගැල්ම හා වෙනත් ස්වාභාවික විපත් නිසා පැන නගින ගැටළු යන මේවා ය. පරිසරයත් සංවර්ධනයත් අතර පවත්නා මෙකී ගැටළුවලට තුඩු දෙන ප්‍රධාන හේතු නම් දුප්පත් කම, ජනගහන වර්ධන අනුපාතය බෙහෙවින් වැඩිවීම සහ ආර්ථික සංවර්ධනයේ රිත්මය බොහෝ බාලවීමත් ය.

මෙකී ගැටළු නිරාකරණය කැර ගැනීමට නම් මේ රටවල ආර්ථික සංවර්ධනය සෑහෙන තරම් වේගවත් කිරීම අවශ්‍ය ය. කෘෂිකර්මය නවීකරණය කිරීම, කාර්මිකකරණය සහ නව උපව්‍යූහ සංවර්ධනයක් විශාල වශයෙන් සිදු කිරීම ද මීට ඇතුළත් වේ. මේ කටයුතු වලින් සංවර්ධනය වන රටවල මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස් කෙරෙන අතර එකී රටවල පාරිසරික තර්ජන සම්බන්ධයෙන් උත්තර ගෝලීය රටවල සංවර්ධන ක්ෂේත්‍රයෙහි ලක්ෂණ වශයෙන් දැනට දක්නා ලැබෙන ගෝලීය ගැටළු වන, හරිතාගාර වායු විමෝචනය, අම්ල වැසි, විෂ අපද්‍රව්‍ය නිෂ්පාදිත ආදිය නව මානයක් ඉදිරිපත් කෙරෙනු ඇත.

පෘථිවි පරිසරය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන ගෝලීය ප්‍රයත්නයෙහි ලා, සංවර්ධනය වන රටවල් පිළිබඳ අනාගත දර්ශනය මගින් උතුරු ගෝලීය රටවලින් මූලික ඉල්ලීම් දෙකක් ඉදිරිපත් වේ. එනම්

(1) දැනට "පාරිසරික ඉඩකඩවලින්" නොහොත් පෘථිවියේ වාහක ශක්තියෙන් විශාල කොටසක් ප්‍රයෝජනයට ගන්නා උතුර, දකුණේ සංවර්ධන කටයුතු කරගෙන යාමට ඉඩ දෙනු සඳහා යුක්ති සහගත පදනමක් මත එකී ප්‍රමාණය අඩු කෙරෙන අන්දමේ සැකසීමක් කළ යුතු ය. (2) පාරිසරික හායනය අඩු කිරීම සඳහා තමන් විසින් ම නව තාක්ෂණයන් යොදා ගන්නා අතර ම සංවර්ධනය වන රටවලට ද ඒවා ලබා ගැනීමට ඉඩ සැලසිය යුතු ය.

එවිට මතු වන ප්‍රශ්නය නම් දකුණු ආසියානු කලාපයට අයත් රටවල මෙන් ම සංවර්ධනය වන වෙනත් බොහෝ රටවල ද ආර්ථික සංවර්ධනයට බාධා පමුණුවන කරුණු මොනවා ද යන්නයි.

සාක් කලාපයට අයත් එක් එක් රටක් තම රටට විශේෂ වශයෙන් බලපාන ප්‍රශ්න ගැන ක්‍රියා කිරීමට යත්න දරන්නේ ග්‍රාම සංවර්ධනය, කාර්මීකරණය, ජනගහන පාලනය, සෞඛ්‍ය, සනීපාරක්ෂක නිවාස ව්‍යාපෘති, දූෂණ පාලන ක්‍රියාමාර්ග හඳුන්වා දීම, ජල ගැලීම් පාලන ව්‍යාපෘති, සංවර්ධන ව්‍යාපෘති තුළට පාරිසරික ප්‍රවේදිතාවන් ඇතුළත් කිරීම, වනහරණය පාලනය කිරීම, කෘෂිකාර්මය තුළට දියුණු වූ භෝග වගා රටාවන් හඳුන්වා දීම, ජල සම්පත් කළමනාකරණය වැඩි දියුණු කිරීම, ආදී ක්‍රියාමාර්ග තුළිනි. ඇතැම් රටවල් ජාතික සංරක්ෂණ උපාය මාර්ග සංවර්ධනය කොට ඇති අතර අනෙක් රටවල් ඒ අනුව වැඩ කරති. ජාතික සැලසුම් සම්පාදනය තුළට සහ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළට පාරිසරික ප්‍රවේදිතාවන් ඇතුළත් කරනු ලැබ ඇත. කෙසේ වුව ද, ප්‍රමාණවත් මූල්‍ය සම්පත් හිඟකම හේතු කොට ගෙන මේ සියලු කටයුතු බරපතළ ලෙස අඩාල වී ඇත.

මීට ප්‍රතිකර්ම යෙදිය යුතුව. ඇත්තේ නව සහ අතිරේක මූල්‍ය සම්පත් ලබා දීම මගින් පමණක් නොව පවත්නා ලෝක ආර්ථික පටිපාටියෙහි බරපතළ වෙනස්කම් ඇති කිරීම ද මගිනි. උග්‍ර ජාත්‍යන්තර ණය බරින් මිරිකුණු වඩා දුප්පත් රටවලට, ප්‍රමාණවත් ආර්ථික වර්ධන අනුපාතයක් ලබාගැනීම සඳහා මූල්‍ය සම්පත් ඒකරාශී කළ නොහැකි ය. දුප්පත් රටවල් ආර්ථික සංවර්ධන වැඩසටහන් වලට බාධා පමුණුවන අනෙක් සාධක නම් ධනවත් රටවල් විසින් පාලනය කරනු ලබන ලෝක වෙළෙඳ පොළ තුළ වෙළෙඳ ද්‍රව්‍යවල මිල පහත වැටීම සහ වෙළෙඳාම පිළිබඳ සීමා කිරීම් ද යන මේවා ය.

විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයන් තුළ පුහුණු මිනිස් බල සම්පත් නොමැති වීමත් පාරිසරික වශයෙන් හිතකර තාක්ෂණ ක්‍රම ලබා ගත නොහැකි වීමත් ඒවා සඳහා වූ පිරිවැය අධික වීමත් නිසා ද දකුණු ආසියානු රටවලට බාධා ඇති වේ. උතුරට විශේෂඥ මිනිස් බලය අඛණ්ඩ ව ගලා යාම ද මේ තත්ත්වය තවත් උග්‍ර වීමට හේතු වී ඇත.



**මූලික ප්‍රතිපත්ති**

"උන්සෙඩ්" සංවිධානය විසින් ගනුලැබීමට නියමිත ක්‍රියාමාර්ග සහ එහි පසු-විපරම් කටයුතු ද කෙරෙහි පහත සඳහන් මූලික ප්‍රතිපත්ති අවධාරණය කරනු ලැබිය යුතු ය:

1. තම ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කරන ආර්ථික සංවර්ධන ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමට ඌන සංවර්ධිත රටවලට ඇති මූලික අයිතිවාසිකම් ලෝකය පිළිගත යුතුය.
2. සංවර්ධනය වන රටවලට සිය සංවර්ධන වේගය වැඩි කරගැනීම සඳහා අවස්ථාවක් සලසා දෙනු වස් ආර්ථික සංවර්ධනයට ඇති බාධක ඉවත් කිරීමට සහ ලෝක ආර්ථික පටිපාටිය ප්‍රති-ව්‍යුහගත කිරීමට ද, විශේෂයෙන් ම සංවර්ධිත රටවල්, ජාත්‍යන්තර සහයෝගිතාව දැක්විය යුතු ය.

3. සංවර්ධනය වන රටවල පරිසර හායනයට ප්‍රධාන හේතුව දුප්පත්කම වන අතර දිළිඳුබව මුලිනුපුටා දැමීමට ලෝක ප්‍රජාව සංවිධානශීලී ලෙස උත්සාහ දැරිය යුතු ය.

4. පෘථිවියේ ප්‍රවර්තන ශක්තියට නියත සීමාවන් ඇත. ස්වාභාවික සම්පත් විශාල ප්‍රමාණයක් පාවිච්චියට ගන්නා වූ ද, අපද්‍රව්‍ය නිෂ්පාදන විශාල ප්‍රමාණයක් මුදාහරින්නා වූ ද සංවර්ධිත රටවල් පෘථිවියේ ප්‍රවර්තන ශක්තියෙන් විශාල වශයෙන් අසමානුපාතික කොටසක් අධික ලෙස ප්‍රයෝජනයට ගනිති. සංවර්ධනය වන රටවලට ප්‍රමාණවත් සංවර්ධන මට්ටමක් ළඟා කර ගත හැකි වනු පිණිස ඔවුනට පෘථිවියේ ප්‍රවර්තන ශක්තියෙන් යුක්ති සහගත කොටසක් ලැබෙන අයුරින් මෙකී අසමතාව නිවැරදි කළ යුතු වේ.

5. උපද්‍රවකාරී සහ ධූලක අපද්‍රව්‍ය මුදාහැරීම ද ඇතුළුව දූෂක ද්‍රව්‍ය පරිසරයට නිකුත් කිරීම ප්‍රධාන කොටම සිදු ක රනුයේ සංවර්ධිත රටවල් වන බැවින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමේ මූලික වගකීම ඇත්තේ එකී රටවලට ය.

## "උන්සෙඩ්" සාකච්ඡා සහ දකුණේ රටවලට ඒවා අදාල වන ආකාරය

සාකච්ඡාවල පදනම ලෙස එ.ජා. මහා සභා යෝජනා අංක 44 / 228

පරිසරය හා සංවර්ධනය පිළිබඳ එ.ජා. සමුළුවක් පැවැත්වීම සඳහා වූ අංක 44 / 228 දරණ එ.ජා. යෝජනාව සාක් රටවල් විසින්, සංවර්ධනය වන වෙනත් රටවල් ද සමග, පොදුවේ පිළිගන්නා ලදි. පරිසර හායනයත් ආර්ථික වශයෙන් දියුණු නොවූ රටවල වසන, ලෝක ජනගහනයෙන් සියයට 80 කට අධික ජනගහනයට මුහුණපෑමට සිදුව ඇති සංවර්ධන ප්‍රශ්න රාශියත් අතර පවත්නා සමීප සම්බන්ධතාව සමුළුව හැඳින්වෙන නාමයෙන් ම පිළි ගැනේ. එ.ජා. යෝජනාවෙහි අන්තර්ගත පහත සඳහන් ප්‍රකාශ විශේෂ වැදගත් කමකින් යුතු ඒවා වශයෙන් සටහන් කරනු ලැබේ.

- පරිසරයේ තත්ත්වය පිරිහී යාමෙන් ද පෘථිවියේ ජෛවාධාර පද්ධතීන් බරපතළ ලෙස හායනය වීමෙන් ද එමෙන් ම, නොකඩවා පැවතීමට ඉඩ හළ හොත්, ගෝලීය පාරිසරික සමතුලිතතාව බිඳී යාමටත් පෘථිවියේ ජීවීන්ගේ පැවැත්මට ආධාර වන ගුණාංගවලට අනතුරු පැමිණීමටත් හේතු විය හැකි වූ සහ පාරිසරික ව්‍යසනයකට තුඩු දිය හැකි වූ ප්‍රවණතාවන්ගෙන් ද මහත් සේ සංවේගයට පත් ව.....
- "පරිසරයේ ආරක්ෂාවත් එහි තත්ත්වය උසස් කිරීමත් සඳහා ජාත්‍යන්තර මට්ටමින් ගනු ලැබීමට නියමිත ක්‍රියාමාර්ගවල දී ලෝකයේ නිෂ්පාදන සහ පරිභෝජන රටාවන් පිළිබඳ දැන් පවත්නා අසමතාව සම්පූර්ණ වශයෙන් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.
- "වෙනත් කරුණුවලට හැකියාවන්ට අනුව, පරිසරයේ ආරක්ෂාවත් ප්‍රතිසංස්කරණයත් එහි තත්ත්වය උසස් කිරීමත් සඳහා සියලු රටවල් විසින් ඵලදායී පියවර ගනු ලැබීමේ වැදගත්කම අවධාරණය කරමින් ....."
- " ......... විශේෂයෙන් ම, පාරිසරික වශයෙන් හිතකර තාක්ෂණයන්, ක්‍රියාවලීන්, උපකරණ, අදාල පර්යේෂණ සහ විශේෂඥතාව ද ජාත්‍යන්තර සහයෝගීතාව තුළින් වාසිදායක ලෙස ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සංවර්ධනය වන රටවල අවශ්‍යතාව ....."
- " ........... පාරිසරික ආරක්ෂාව සඳහා වූ ගෝලීය ප්‍රයත්නයන්ට පූර්ණ ලෙස සහභාගීවීම ගැන සහතික වනු වස් සංවර්ධනය වන රටවල් කරා නව සහ අතිරේක සම්පත් යැවිය යුතු ය....."
- "...... දියුණු වන රටවල සහ උග්‍ර ණය සේවා ගැටළුවලින් යුත් වෙනත් රටවල පවත්නා බරපතළ ණයගැති භාවය ගැන කාර්යක්ෂම ලෙසත් කඩිනමිනුත් ක්‍රියා කළ යුතු ව ඇත..."
- "දුප්පත්කම තුරන් කර දැමීම මගින්, නාගරික මුඩුක්කුවල සහ ගම්බද පෙදෙස්වල වසන දුප්පතුන්ගේ ජීවන වට පිටාව සහ වැඩ කරන වට පිටාව වැඩි දියුණු කිරීම....."
- "මානව සෞඛ්‍ය තත්ත්වයන් ආරක්ෂා කිරීම සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම."
- "දුප්පත්කමට එරෙහි ව ක්‍රියා කිරීමේ හා ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් යුතු ව, සියලු රටවල ප්‍රවර්තනීය වූත් පාරිසරික වශයෙන් හිතකර වූත් සංවර්ධනයක් ඇති කිරීමට හේතු වන ආධාරකාරී ජාත්‍යන්තර ආර්ථික පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය නිශ්චිත කාර්යයන් උදෙසා රාජ්‍යයන් විසින් සහ රාජ්‍යාන්තර සංවිධාන විසින් ද නිශ්චිත ගිවිසුම් හා බැඳීම් ඇති කර ගනු ලැබීමේ අරමුණින් යුත් ජාතික හා ජාත්‍යන්තර ක්‍රියා-මාර්ග සඳහා වූ උපායමාර්ග විමසා බැලීම, සහ සංවර්ධන සැලසුම් සම්පාදනය තුළට සහ ප්‍රතිපත්ති තුළට පාරිසරික ප්‍රවේදිතාවන් සහ සැලකුම් ඇතුළත් කිරීමේ දී ආධාර සම්බන්ධ-යෙන් හෝ සංවර්ධනයට අදාල මුදල් යෙදවුම් සම්බන්ධයෙන් හෝ අලුතෙන් අසම්භාව්‍යතා ඇතුළත් කිරීම සඳහා එය ප්‍රයෝජනයන්ට නොගත යුතු බවත් වෙළෙඳාම පිළිබඳ අසාධාරණ බාධක ඇති කිරීම උදෙසා එය ව්‍යාජ

හේතුවක් කොට නොගත යුතු බවත් සිත තබා ගැනීම."

- "පරිසරයේ ආරක්ෂාවත් අභිවර්ධනයත් සඳහා, විශේෂයෙන් ම සංවර්ධනය වන රටවල, මානව සම්පත් සංවර්ධනය නංවාලීම"

## දකුණේ ප්‍රවේදිතාවන්

පරිසරය හා සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුවක් පැවැත්වීමේ එ.ජා. යෝජනාව තමන් සතුටින් පිළිගත් නමුදු, කාර්ය සම්පාදනය ස්වකීය ආසන්නතම ප්‍රවේදිතාවන් ගෙන් බැහැර වන ලෙස මෙහෙය වනු ලැබීමේ දී දකුණු ආසියානු රටවල් සහ ඇත්ත වශයෙන් ම සංවර්ධනය වන සියලු රටවල් මුල දී බලාපොරොත්තු කඩ වූ තත්ත්වයකට පත් වූහ. සූදානම් වීමේ ක්‍රියාවලිය පිළිබඳව මුල දී ප්‍රධාන අරමුණ යොමු වී තිබුණේ ගෝලීය පාරිසරික ප්‍රශ්න කෙරෙහි ය. මෙකී ප්‍රශ්න නිසැක වශයෙන් ම වැදගත් වූ නමුදු කාර්මික වූ රටවලට පමණක් තනිවම වුව ද එක්රැස් වී මෙකී ගැටළු නිරාකරණය කිරීම සඳහා ප්‍රතිකර්ම යෙදීම ගැන තීරණය කළ හැකිව තිබුණි. මක්නිසා ද යතහොත්, එකී ප්‍රශ්න උද්ගත වන්නේ එකී රටවල පවත්නා සංවර්ධන රටාවන්, ජීවන ක්‍රම සහ ඉහළ මට්ටමේ පරිභෝජන තුළින් බැවිනි.

ලබන බැවින් දිළිඳු බවේ ගැලී සිටින දුප්පත් රටවල්, ආර්ථික සංවර්ධන ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමේ දී, සියලු සංකීර්ණ ගැටළුවලට එරෙහිව සටන් වැදීම පිළිබඳ ප්‍රබල ප්‍රශ්නයට මුහුණ පා සිටිති. මෙය, තුන්වැනි ලෝකයේ පරිසරයත් සංවර්ධනයත් පිළිබඳ ප්‍රශ්න ඇතුළත කේන්ද්‍ර ගතව පවතින අතර "උන්සෙඩ්" සමුළුවේ පූර්ව ක්‍රියාවලිය තුළ දී එය විසින් කරන ලද යෝජනාවට ඉහළ ම ප්‍රමුඛත්වය ලැබිය යුතු ය. සමුළු පූර්ව ක්‍රියාවලියට අයත් අවසාන මාස කීපයේ දී මෙකී ප්‍රශ්න, "21 කාර්ය සටහනේ" ප්‍රධාන ක්ෂේත්‍රයන්හි දී මතුවීම අපගේ භාග්‍යයක් සේ සැලකිය හැකි වන අතර ඒ කෙරෙහි විශාල වශයෙන් සැලකිල්ල යොමු වී ඇත.

## ගෝලීය ප්‍රවේදිතාවන්

පරිසරයට ගෝලීය මට්ටමින් එල්ල වන තර්ජන ගැන සැලකීමේ දී, මිනිසාගෙන් කුළු ගැන්වුණු කාලගුණ විපර්යාසය, ඕසෝන් ස්තරය පිරිහී යාම, දේශසීමා ඉක්මවා සිදුවන වායුගෝලීය දූෂණය සහ විෂ අපද්‍රව්‍ය මුදාහැරීම ද බෙහෙවින් ම හානිකර ඒවා අතර වෙති. සාක් රටවල් ගැන සැලකීමේ දී මුහුදු මට්ටම ඉහළ යාම තවදුරටත් එසේ ම පැවතුන හොත්, මාලදිවයින, බංගලාදේශය සහ ශ්‍රී ලංකාව



පරිසරය හා සංවර්ධනය පිළිබඳ ජගත් සමුළුවක අවධානයට මුලින් ම ලක් විය යුත්තේ මනුෂ්‍ය වර්ගයාගේ විශාල බහුතරය වන තුන්වැනි ලෝකයේ රටවල වෙසෙන ජනතාව මුහුණපාන පරිසරය හා සංවර්ධනය පිළිබඳ ප්‍රශ්න කෙරෙහි ය. මොවුන් ගේ ගැටලු විසඳීම සඳහා සැබෑ ජාත්‍යන්තර සහ ගෝලීය පරිශ්‍රමයක් අවශ්‍ය වේ. බොහෝ කොට ම පොහොසත් රටවල් විසින් වෙළෙඳ පොළ ද සම්පත් ගලනය ද මිල සහ තාක්ෂණය ද පාලනය කරනු

කෙරෙහි එය භයානක ලෙස බලපානු ඇත. ගෝලීය පරිසරයට සිදු වී ඇති තර්ජන ප්‍රධාන කොට ම ඇති කරන ලද්දේ සංවර්ධිත රටවල ක්‍රියා කලාපයන් විසිනි. සීමිත සම්පත් ප්‍රමාණයක් හිමි ව ඇති. සංවර්ධනය වන රටවලට, ඉහත කී ක්‍රියාවන්ගෙන් සිදු වන අහිතකර බලපෑම් ගැන ඵලදායී අයුරින් ක්‍රියා කළ හැකි වන්නේ ඉතා මද වශයෙනි. එබැවින්, ගෝලීය පාරිසරික බාධාවන් ගෙන් බෙහෙවින් ම පීඩා විඳින්නේ මොවුන් ය.

ගෝලීය පාරිසරික ප්‍රශ්න සම්බන්ධයෙන්, වෙන ම ප්‍රඥප්ති දෙකක් "උන්සෙඩ්" සමුළුව උදෙසා කල්වේලා ඇති ව නිම කිරීම සඳහා දැන් සකස් කැර ගෙන යනු ලැබේ. ඒවා නම් (1) දේශගුණික විපර්යාසය පිළිබඳ පාදක ප්‍රඥප්තියක් සහ (2) ජෛව විවිධත්වය පිළිබඳ ප්‍රඥප්තියක් යන මේවා ය.

කෙටුම්පත් ප්‍රඥාප්ති පිළිබඳ සාකච්ඡා ඉතා දීර්ඝ වූ අතර රැස්වීම් ගණනාවක් දක්වා විහිදී ගියේ ය. යළිදු, මෙයින් දුප්පත් රටවලට බරපතළ අවාසි සිදු වේ. මක්නිසා ද යත් ඔවුන් සතු විශේෂඥ මිනිස්බල සහ මූල්‍ය සම්පත් ඉතා සීමිත වීමත් නිරතුරුව පැවැත්වෙන රැස්වීම්වලට නියෝජිතයන් යැවීමට ඔවුන්ට නොහැකි වීමත් නිසා ය. සංවර්ධනය වන බොහෝ රටවල් නියෝජනය නොවන අතර අනෙක් රටවලින් යැවෙන්නේ එක් නියෝජිතයකු පමණි. වෙන වෙන කාරක කණ්ඩායම්වල රැස්වීම් එක ම වේලාවට පැවැත්වෙන බැවින් ඒ සියල්ලට සහභාගී වීමට ඔහුට නොහැකි වේ. මේ හේතු කොට ගෙන මෙකී සාකච්ඡා, දකුණෙන් මතුවන හුදෙකලා හඬ කීපයක් සහිත ව උතුරේ ආධිපත්‍යයට යටවීමට මඟ පෑදේ.



ගෝලීය කාලගුණික විපර්යාස ගැන සලකා බලන විට පෙනී යන සත්‍යය නම්, වායුගෝලයේ ඇති හරිතාගාර වායු වඩ වඩාත් අධිකවීම පිළිබඳ ව උතුර අතිශයින් ම වගකිව යුතු වන බව සහ ඒවා ඉතා අධික ප්‍රමාණයෙන් මුදාහැරීම නොකඩවා සිදුවන බවත් ය. වායුගෝලය මුළු මිනිස් වර්ගයාගේ ම පොදු උරුමය බවත්, මෙකී සම්පත ප්‍රයෝජනයට ගැනීමේ දී යුක්ති සහගත භාවයක් තිබිය යුතු බවත් පිළිගත යුතුව ඇත. මෙකී සම්පත ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව දැන් පවත්නා රටාවන්, තම සංවර්ධන අවශ්‍යතා සපුරාගැනීම සඳහා දකුණට දැනට වඩා "පාරිසරික ඉඩකඩ" ලැබෙන සේ උතුරේ රටවල් විසින් අධික මුදාහැරීම් අඩු කිරීම මගින් නිවැරදි කරනු ලැබිය යුතු වේ. මෙකී වෙනස් කිරීම් සඳහා යන වියදම් උතුරේ රටවල් විසින් දරනු ලැබිය යුතු ය. උතුර විසින් විමෝචනයන් අඩු කරනු ලැබීමේ දී සම්මත වැඩසටහනක් සහ කාල නියමයක් ද අනුගමනය කරනු ලැබිය යුතු ය.

විමෝචන අයිතීන් පිළිබඳ රාෂ්ට්‍රාන්තර වෙළෙඳාමට අදාළ ප්‍රතිපත්තිය පිළිගනු ලැබීමට නම්, එය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ආයතනමය වැඩපිළිවෙලක් තිබිය යුතු ය. වැඩසටහනේ මූලිකාංගයක් වශයෙන් බලශක්ති ක්ෂමතාව ඇතුළත් වන ප්‍රවර්තනීය සංවර්ධන ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට දකුණේ රටවලට හැකිවන සේ වරණීය සහ වාණිජ නොවන කොන්දේසි මත සකස් වූ ද පාරිසරික වශයෙන් හිතකර වූ ද තාක්ෂණයන් වැඩි දියුණු කිරීම සහ පැවරීම පිළිබඳ ගෝලීය වැඩසටහනක් ඇති කර ගත යුතු වේ.

ජෛව විවිධත්වය පිළිබඳ යෝජිත ප්‍රඥප්තිය කෙරෙන්, එය දකුණේ රටවලට අදාළ වන ආකාරය සම්බන්ධයෙන් වඩාත් සංකීර්ණ සහ වඩාත් විවාදාත්මක ප්‍රශ්න පැන නගී. වායුගෝලය මෙන් නොව, ජාතික දේශසීමාවන් ඇතුළත හට ගන්නා ශාක හා සත්ව විශේෂ ඒ ඒ රාජ්‍යවලට අයත් දේපළ වේ. උතුරේ රටවල් විසින් අධික ඵලදාව සහිත බෝග පැළෑටි, ඖෂධ වර්ග සහ කාර්මික අමුද්‍රව්‍ය ද, ජාන සම්පතින් පොහොසත් වූ දකුණේ රටවල් විසින් සපයනු ලබන නමුදු එවැනි සංවර්ධන කාර්යයන් තුළින් දකුණේ රටවලට ලැබෙනුයේ ඉතා සුළු ප්‍රයෝජනයකි. නැතහොත්, ඔවුහු කිසිදු ප්‍රයෝජනයක් නොලබති. එබැවින්, දකුණේ රටවල් විසින් ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම පිළිබඳ කරුණෙහි දී, එබඳු සංරක්ෂණයක වියදම්, භාවිතය සහ ප්‍රයෝජන හා සම්බන්ධ සාධාරණත්වය පිළිබඳ ප්‍රශ්නය දකුණේ රටවල් විසින් නැවත වරක් මතු කරනු ලැබේ.

ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමට හා කෙළින් ම සම්බන්ධ වූ වැදගත් ප්‍රශ්නයක් අදාළ වන්නේ දකුණේ රටවලින් ලබා ගැනෙන ජාන වලින් සැකසෙන ජෛව තාක්ෂණික නිෂ්පාදිතයන්ට ය. ජාන සම්පත් දකුණෙන් ලබා ගැනෙන අවස්ථාවන්හි දී, ජාන තාක්ෂණයේ නිෂ්පාදිතයන් දකුණේ රටවලට ලබා ගැනීමට හැකිවන විධි විධාන ජෛව විවිධත්වය පිළිබඳ ඕනෑ ම ජාත්‍යන්තර ප්‍රඥප්තියක අන්තර්ගත විය යුතු ය. විශේෂ බුද්ධිමය දේපොළ හිමිකම් ක්‍රම වැඩි දියුණු කර ගැනීම ද දකුණේ බිහි වන ජෛව සම්පත් සඳහා උචිත වන්දි ගෙවීමේ කාර්ය ක්‍රම ද තම දේශසීමා ඇතුළත පිහිටි ජාන ප්‍රයෝජන යට ගෙන වැඩි දියුණු කර ගන්නා ලද ජෛව තාක්ෂණයන්ට පිවිසීමේ මාර්ග දකුණේ රටවලට සැලසෙන ආකාරයේ කාර්ය ක්‍රම ද සඳහා විධි විධාන ප්‍රඥප්තියට ඇතුළත් විය යුතු ය.

පාරිසරික ප්‍රශ්නවලට අදාල ව දැනටමත් අත්සන් කරනු ලැබ ඇති (මොන්ට්‍රියල් ගිවිසුම සහ බැසල් ප්‍රඥප්තිය බඳු) ප්‍රඥප්ති සම්බන්ධයෙන් සැලකීමේ දී එහි දී ද දුප්පත් රටවල් පැහැදිලි ලෙස ම අවාසිදායක තත්ත්වයකට පත්ව ඇත. මේ ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරීමේ දී දැනටමත් උග්‍ර ලෙස බර පැටවී ඇති ආර්ථිකය සහ මිනිස් බල සම්පත් පීඩාවට ලක් වේ.

**"උන්සෙඩ්" සමුළුවෙන් දකුණු ආසියාවට බලාපොරොත්තු විය හැක්කේ කුමක් ද?**

උන්සෙඩ් සමුළුවේ සාකච්ඡා කරනු ලැබීමට නියමිත කරුණු අතර පහත සඳහන් ඒවා වේ.

(අ) මනුෂ්‍යයන්ට සහ වෙනත් ජීවී වර්ගවලට සැනසිලිදායක වාසභූමියක් වශයෙන් පෘථිවියේ අනාගත ස්ථායීතාව සහ අඛණ්ඩතාව සහතික කෙරෙන පරිදි පරිසරය හා සංවර්ධනය පිළිබඳ මිහිතල ප්‍රඥප්තියක් ප්‍රකාශයට පත් කිරීම.

(ආ) කාලගුණික විපර්යාස සහ ජෛව විවිධත්වය පිළිබඳ ගිවිසුම්.

(ඇ) 21 වැනි කාර්ය සටහන: 1992 න් එහා කාලසීමාව සඳහා විසි එක්වැනි සියවස සඳහා සම්මත වැඩසටහන. වැඩසටහන් ක්ෂේත්‍ර විශාල සංඛ්‍යාවක් මීට ඇතුළත් වන අතර, වෙනත් කරුණුවලට අමතර ව, තාක්ෂණ පැවරුම්, හැකියාවන් තර කිරීම, දිළිඳුකමට එරෙහිව සටන් කිරීම, සෞඛ්‍යය සහ සනීපාරක්ෂාව ආදිය සහ මෙකී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අලුතෙන් සහ අතිරේක ව අවශ්‍ය වන මූල්‍ය සම්පත් ද මීට අයත් වේ.

එ.ජා. මහා සභා යෝජනා අංක 44/228 කෙටුම් පත් කෙරෙන අවස්ථාවේ මුලදී ම, පරිසරය හා සංවර්ධනය අතර පවත්නා සම්බන්ධය පිළිගනු ලැබූ නමුත් තුන්වැනි ලෝකය තුළ වෙසෙන ලෝක මනුෂ්‍ය ප්‍රජාවෙන් සියයට 80 ක් වූ මිනිසුන් මුහුණ පාන වැදගත් සංවර්ධන ප්‍රශ්න කෙරෙහි "උන්සෙඩ්" සමුළු මූලාරම්භයේ දී ප්‍රමාණවත් අවධානයක් යොමු වූ බවක් නො පෙනේ. අන්ත දිළිඳු බව සහ විශාල සම්පත් පරතරය පරිසර හායනය පිළිබඳව ලෝකය සිසාරා විහිදී ගොස් ඇති මූලික හේතූන් ය. ණය බර, සම්පත් ආපස්සට ගලායාම සහ වෙළෙඳාම පිළිබඳ අහිතකර කොන්දේසි වැනි මූලික ප්‍රශ්න ගැන සැලකිල්ල යොමුකොට ඒවා විසඳිය යුතුවාක් මෙන්ම, දකුණේ රටවල දුප්පත්කම තුරන් කිරීමත් මුළු සම්පත් පරතරය පියවා දැමීමත් සඳහා වූ ගෝලීය සැලැස්මක් සමුළුවේ න්‍යාය පත්‍රයේ වැදගත් ම විෂයයක් වශයෙන් ඇතුළත් විය යුතු ය.

මිහිතල සමුළුව වැදගත්කමින් අන් සියලු වේදිකාවන් අභිබවා සිටින අතර එහි බලතලවලට අදාල වන ඕනෑම විෂයයක් කෙරෙහි එහි අවධානය යොමු විය යුතුවාක් මෙන් ම එය අන් තැනෙක කැරෙන සාකච්ඡාවක විෂය කරුණුවලට ඇතුළත් වෙතැයි යන හේතුව මත පසෙකින් නො තැබිය යුතු ද වේ.

තුන්වැනි ලෝකයේ පරිසරයත් සංවර්ධනයත් පිළිබඳ ප්‍රශ්න සම්භාරය කෙරෙහි සැලකිල්ල යොමු වීමට නම් මෙකී විෂයයන් ඇතුළත් කිරීම අත්‍යර්ථ යෙන් ම වැදගත් වේ. කුමක් හෙයින් ද යතහොත්, "උන්සෙඩ්" සමුළුවේ පරමාර්ථ සපුරා ගැනීමෙහි ලා එසේ කිරීම අවශ්‍ය ම බැවිනි. උතුරු-දකුණු සම්පත් ගලායාම් පිළිබඳ අනුගම්‍ය ගිවිසුම් සංවර්ධනය කර ගැනීම උදෙසා වූ උපදේශමාලා සහ කාල නියමයන් ද දුප්පත් රටවල ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධන කිරීම කෙරෙහි යොමු වූ ගෝලීය ආර්ථික සම්බන්ධතා ප්‍රතිව්‍යුහගත කිරීම ද දක්වමින් මූලික කාර්ය සැලැස්මක් සමුළුවේ දී සම්මත කර ගනු ලැබිය යුතු ය.

දේශගුණ විපර්යාස හා ජෛව විවිධත්වය ගැන සැලකීමේ දී සාධාරණත්වයේ මූලධර්මයන් එකමුතු කිරීමේ බලවේගය ලෙස පිළගනු ලැබිය යුතුය. තවමත් දිගින් දිගට සාකච්ඡා වෙමින් පවත්නා කෙටුම්පත් නිම කර ගැනීම සඳහා මාර්ගය පැහැදිලි වනු ඇත්තේ මෙය ඉටුවෙතොත් පමණි.

මහ සමුළුවේ දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහාත් මෙහෙයුම් උදෙසා මුදල් යෙදවීමත් සහ ඒවා අධීක්ෂණය කිරීම සඳහාත් උචිත ආයතනමය වැඩ පිළිවෙලවල් යෙදීම ද සමුළුවේ පශ්චාත් කටයුතුවල සාර්ථකත්වය සඳහා

අතිශයින්ම වැදගත් වේ. දැනට පවත්නා කාර්ය ක්‍රම අවශ්‍ය තත්ත්වයට නොමැති බවත් සංවර්ධනය වන රටවල පරිසරයත් සංවර්ධනයත් පිළිබඳ ස්වභාවය සහ ප්‍රචාරනය වටහා ගන්නා අභිනව සහ නව තාවයෙන් යුත් යන්ත්‍රණයන් හෙවත් කාර්ය ක්‍රම අවශ්‍ය බවත් සංවර්ධනය වන බොහෝ රටවල අදහස වේ. එසේම මෙකී ආයතනවල කළමනාකරණය සහ පාලනය එ.ජා.පද්ධතිය තුළ ප්‍රජාතාන්ත්‍රික ලෙස සංවිධානය කරනු ලැබීමත් එසේ සංවිධානය කරනු ලැබ ඇති බව පෙනෙන්නට තිබීමත් අත්‍යාර්ථයෙන්ම අවශ්‍ය වේ.

ජාත්‍යන්තර ගිවිසුම් පිළිබඳව කටයුතු කිරීමේ දී දැන් පවත්නා ගිවිසුම් ක්‍රියාත්මක කිරීමෙහි ලා සංවර්ධනය වන රටවලට මුහුන්දෙන්නට සිදුව ඇති පීඩනයන් ගැන සමුළුව නොතකා හැරිය යුතු නොවේ. පරිසරයට හා සංවර්ධනයට අදාල සියලුම ගිවිසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව විස්තර සහිතව කරුණු ඇතුලත් යෝජනා උන්සෙඩ් සමුළුවේ දී සම්මත කර ගත යුතුයැයි සිතීම සීමාව ඉක්මවා යාමක් විය හැකි අතර, දුප්පත් රටවලට සහන සැලසීම පිළිබඳ පදනම් සමුළුව විසින් නියම කොට දක්වනු ලැබිය යුතුය.

නව ජගත් පටිපාටියක උදාව මිහිතල සමුළුවෙන් සලකුණු වෙතැයි සංවර්ධනය වන රටවල් බලාපොරොත්තුවන අතර, මෙය මුදුන්පත් කැර ගැනීමට නම් ජාතීන් විසින් තම පටු ජාතික සීමාවන් ගෙන් ඔබ්බට නෙත් යොමුකොට පෘථිවි ග්‍රහලෝකය සියලු මනුෂ්‍ය වර්ගයාට සැනසිලි දායක නිවාස ස්ථානයක් බවට පත් කිරීම සඳහා එහි පරිසරයේ තත්ත්වය උසස් කිරීම කෙරෙහි සිහි යොමු කිරීම අවශ්‍ය වේ.

